ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023
**SNU5341/ ESU3141-** අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.11.04 වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. උපදේශනයේ ප්‍රධාන ආචාර ධර්මයක් ලෙස "පෞද්ගලික ලාභ ප්‍රයෝජන ලබා නොගැනීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්නත් විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට උපදේශනය ලබා දීමෙහි දී මෙම ආචාර ධර්මය පිළිපැදීමෙහි ඇති වැදගත්කමත් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. උපදේශනයේ මනෝ විශ්ලේෂණාත්මක ප්‍රවේශයෙහි මූලික දර්ශනය කෙටියෙන් විස්තර කරන්න.

03. භෞතික හා මානව සම්පත් ඇතුළුව පාසල් වෘත්තීය උපදේශන සේවාවක ප්‍රධාන සංරචක විශ්ලේෂණය කරන්න.

04. ප්‍රාථමික පාසල් ළමුන් සඳහා පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සංවිධානයක් මඟින් සපයනු ලබන ප්‍රධාන සේවා පහක් (05) ලැයිස්තුගත කරන්න.

05. සුදුසු උදාහරණ දක්වමින් අධික්‍රියාශීලී හැසිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න විස්තර කරන්න.

06. ප්‍රධාන උපාය මාර්ග තුනක් (03) අවධාරණය කරමින් ගුරුවරයකු විසින් විකලාංග සහිත ළමයෙකු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට සහභාගී වීම සුසාධ්‍ය කළ හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

07. ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ පොදුවේ දක්නට ලැබෙන ඉගෙනුම් දුෂ්කරතාවලට උදාහරණ තුනක් (03) දක්වමින් "ඉගෙනුම් දුෂ්කරතා" යන සංකල්පය පැහැදිලි කරන්න.

08. පාසල් පද්ධතිය තුළ උපදේශන සේවා ශිල්පක්‍රමයක් ලෙස ප්‍රශ්නාවලි භාවිත කළ හැක්කේ කුමනාකාර සන්දර්භ හෝ අවස්ථා හෝ තුළ ද යන්න විශ්ලේෂණය කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) උපදේශනය යන සංකල්පය සායනික ක්‍රියාවලියක් ලෙස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට පවුල් උපදේශනය ප්‍රයෝජනවත් විය හැක්කේ කෙසේ ද යන්න සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) සුදුසු උදාහරණ ගෙනහැර දක්වමින් වත්මන් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ පාසල් උපදේශකවරයාගේ භූමිකාව විවේචනාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු 12)

10. (i) සුදුසු උදාහරණයක් දක්වමින් "සමායෝගය" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii) විශේෂ අවශ්‍යතා සහිත ළමයෙකුගේ සමාජයීය සංවර්ධනය සහ සමායෝගය අතර ඇති සම්බන්ධතාවය විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(iii) ඔබේ ශිෂ්‍යයින් තුළ මනා ලෙස සමායෝගී වූ පෞරුෂයක් සංවර්ධනය වීම සුසාධ්‍ය කළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ව සමපදස්ථයින් (සේවයේ නියුතු ගුරුවරුන්) කණ්ඩායමක් ඇමතීමට ඔබට ආරාධනා කර ඇතැයි සිතන්න. මේ පිළිබඳව ගුරුවරයෙකු ලෙස ඔබ ගන්නා පියවර අවම වශයෙන් හතරක් **(04)** වත් ඉස්මතු කරමින් ඔබේ කථාව ලියන්න. (ලකුණු 12)

11. "වත්මන් ශ්‍රී ලාංකීය පාසල් සන්දර්භය තුළ මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුමක් ඇත."

(i) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ප්‍රාථමික පාසල් ශිෂ්‍යයන්හට මාර්ගෝපදේශ හා උපදේශන ඒකකයක සේවය අවශ්‍ය වීමට හේතු තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 01 x 03 = 03)

(ii) පාසල් උපදේශකවරයා, විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ප්‍රාථමික පාසල් ළමුන්ගේ දෙමාපියන් සමඟ අන්තර්ක්‍රියා කිරීම වැදගත් වන්නේ මන් ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (අ) නව යෞවනයින්ට මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා යොමු වීමේ අවශ්‍යතාවයක් නිර්මාණය කර තිබෙන වත්මන් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ පවතින අහිතකර තත්ත්ව හෝ සංසිද්ධි හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 01 x 04 = 04)

(ආ) ඉහත (අ) යටතේ ඔබ සඳහන් කළ තත්ත්ව හෝ සංසිද්ධි අතරින් ඕනෑම ඒවා දෙකක් (02) තෝරාගෙන එම එක් එක් තත්ත්වයට හෝ සංසිද්ධියට සාර්ථකව මුහුණ දීම සඳහා නව යෞවනයින්ට උපකාර කිරීමට පාසල් පරිපාලනය විසින් අනුගමනය කළ හැකි උපායමාර්ග දෙකක් **(02)** සාකච්ඡා කරන්න. (ලකුණු 02 x 04 = 08)

12. "ශිෂ්‍යයින්ට වඩා සෞඛ්‍ය සම්පන්න සමස්ත යහපැවැත්මක් අත්දැකීම සඳහා පාසල් උපදේශන සේවා මගින් ආරක්ෂිත සහ උපකාර සපයන අවකාශයක් ලබාදිය හැකි ය."

(i) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා අදාළ වන පොදු මඟ පෙන්වීම් (Guidelines) තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 01 x 03 = 03)

(ii) පාසල් මාර්ගෝපදේශය හා උපදේශනයට සහාය වන වෙනත් වෘත්තීය සේවා දෙකක් **(02)** නම් කර එබඳු සේවා, පාසල් උපදේශන ඒකකය මගින් සපයනු ලබන සේවය අනුපූරණය කරනු ලබන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) (අ) ඔබ කැමති ඕනෑම පාසලක් තෝරා ගෙන එහි පිහිටීම, පාසල් වර්ගය සහ පාසල් සංස්කෘතියෙහි සුවිශේෂී ලක්ෂණ ඇතුළත් කරමින් පාසල පිළිබඳ ලුහුඬු සටහනක් ලියන්න. (ලකුණු 04)

(ආ) ඉහත ඔබ සඳහන් කළ පාසල සඳහා වඩාත් ම සුදුසු පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවන්හි සංවිධාන ආකෘතිය කුමක්දැයි සඳහන් කර ඔබේ එම තේරීම සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

13. (i) ඔබ, ඔබේ පාසලේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා නායකත්වය ගන්නා බව සිතන්න. යෝජිත ඒකකයෙහි අරමුණු තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 01 x 03 = 03)

(ii) එම වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මගින් ඉටු කරනු ලබන සේවාවන් විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) (අ) එලී ගින්ස්බර්ග් (Eli Ginzberg) ගේ වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යායෙහි එන අත්හදා බැලීමෙන් තේරීම් කරන අවධිය උප අවධි හතරකට **(04)** බෙදා දක්වා ඇත. එම උප අවධි අදාළ වයස් පරාස සමඟ නම් කර දක්වන්න. (ලකුණු 01 x 04 = 04)

(ආ) පාසල් උපදේශන හා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය විසින් මෙම උප අවධි හතර **(04)** තුළ ශිෂ්‍යයන්ගේ වෘත්තීය තේරීම් සංවර්ධනය කිරීම සුසාධ්‍ය කළ හැක්කේ කෙසේ ද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර තුළ එක් එක් උප අවධිය සඳහා අවම වශයෙන් එක් **(01)** උපාය මාර්ගයක් වත් අවධාරණය කළ යුතුය. (ලකුණු 02 x 04 = 08)

14. (i) උපදේශන ප්‍රවේශයක් ලෙස හේතුවාදී චිත්තවේගික චර්යා ප්‍රතිකාරයෙහි මූලික දර්ශනය පැහැදිලි කරන්න. (ලකුණු 03 යි.)

(ii) හේතුවාදී චිත්තවේගික චර්යා ප්‍රතිකාරයට අනුකූලව තම සේවාලාභීන්ට සහාය වීමේ දී උපදේශකවරයකු විසින් යොදා ගත හැකි ප්‍රධාන ශිල්පක්‍රම දෙකක් **(02)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(iii) සුවිශේෂී ගැටළු සහ සංවර්ධනාත්මක අවශ්‍යතා සහිත පාසල් ළමුන්හට උපකාර කිරීමෙහි දී හේතුවාදී චිත්තවේගික චර්යා ප්‍රතිකාරයෙහි දායකත්වය අගයන්න. (ලකුණු 12 යි.)

හිමිකම් ඇවිරිණි.